# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත

---

[සහතිකය සටහන් කළේ 1983 මාර්තු මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 මාර්තු මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිල : රු. 1.10

තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත

[සහතිකය සටහන් කළේ 1983 මාර්තු මස 18 වන දින]

එල්. ඩී.—ඕ. 17/81

**සේවායෝජකයන් විසින් තම කම්කරුවන්ට පාරිතෝෂිකයක් ගෙවීම සඳහා ද, ඉඩම් අත්කර ගැනීමේ පනත, ඉඩම් ප්‍රතිසංස්කරණ පනත සහ කාර්මික ආරවුල් පනත සංශෝධනය කිරීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.**

**1.** මේ පනත 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතුය.

## I වන කොටස

**ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත සතු කරන ලද ඉඩම්වල සේවයෙහි නියුක්ත කරන ලද කම්කරුවන්ට පාරිතෝෂික ගෙවීම සම්බන්ධයෙන් සේවායෝජකයන්ගේ බැඳීම.**

**2.** (1) ඉඩම් ප්‍රතිසංස්කරණ පනත ක්‍රියාත්මක වීමෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත සතු කරන ලද කෘෂිකාර්මික ඉඩමක හෝ වතු ඉඩමක හෝ 1971 මැයි මස 29 වන දින හෝ ඉන් පසු ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගනු ලැබ, 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනතේ 21 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාර ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත සතු වී ඇතැයි සලකනු ලබන යම් ඉඩමක, අවස්ථාවෝචිත පරිදි, ඒ සතු කිරීමට හෝ ඒ අත්කර ගැනීමට පෙරාතුව ම සම්පූර්ණ අවුරුදු පහකට නොඅඩු කාලයක් කම්කරුවකු සේවයෙහි නියුක්ත කර ඇති සෑම සේවායෝජකයකු විසින් ම, ඒ කම්කරුවාගේ සේවාවන් වෙනුවෙන් මේ කොටසේ විධිවිධානවලට අනුකූලව ආගණනය කරන ලද පාරිතෝෂිකයක්, මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට දින තිහක කාලයක් ඇතුළත ඒ කම්කරුවාට නැතහොත් ඒ කම්කරුවාගේ මරණය සිදු වී ඇති විටක, ඔහුගේ උරුමක්කාරයන්ට ගෙවනු ලැබිය යුතු ය :

එසේ වුව ද ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාර ඒ සේවායෝජකට තබා ගැනීමට ඉඩ දෙනු ලබන කෘෂිකාර්මික ඉඩමේ කොටස හෝ කොටස් සම්බන්ධයෙන් ඉහතින් වූ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන 1972 අගෝස්තු මස 26 වන දින ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය මගින් සේවායෝජකයකු වෙත නියම කරනු ලබන බැඳීම ඉටු කිරීමට පෙර හා 1972 අගෝස්තු මස 26 වන දින හෝ එදිනට පසු, ඒ සේවායෝජකගේ මරණය සිදු වූ විටක, ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයා විසින් ඒ බැඳීම ඉටු කරනු ලැබිය යුතු ය.

(4) මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ සාදනු ලැබූ හදිසි අවස්ථා (පෙරලා සිය රට යවනු ලබන ඉන්දියානුවන්ට පාරිතෝෂික හා වෙනත් මූල්‍ය ප්‍රතිලාභ ගෙවීමේ) නියෝග

2—ඒ 65477—13,550 (82/09)

මල විධිවිධාන අදාළ වූ හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 34 දරන, පෙරලා සිය රට යවනු ලබන ඉන්දියානුවන්ට පාරිතෝෂික හා වෙනත් මූල්‍ය ප්‍රතිලාභ ගෙවීමේ (විශේෂ විධිවිධාන) පනත අදාළ වන හෝ පෙරලා සිය රට යවනු ලබන ඉන්දියානුවකු වන්නා වූ කම්කරුවකුට හෝ කම්කරුවකු සම්බන්ධයෙන් මේ කොටසේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

පාරිතෝෂිකය ගෙවීමේ අනුප්‍රමාණය.

3. (1) කුලීකරුවකු වශයෙන් සේවයෙහි නියුක්ත කර ඇති කම්කරුවකු—

(අ) සේවක අර්ථ සාධක අරමුදලට දායකවීමට වූ තම බැඳීම ආරම්භවීමට පෙරාතුව වූ සම්පූර්ණ වශයෙන් සේවය කරන ලද එක් එක් වර්ෂය සඳහා 1950 නොවැම්බර් මාසයේ දී ඒ කම්කරුවාට ගෙවන ලද හෝ ගෙවිය යුතු වූ වැටුපේ හෝ වේතනයේ අනුප්‍රමාණය අනුව ආගණනය කරන ලද, දින දහහතරක වැටුපට හෝ වේතනයට සමාන මුදලක පාරිතෝෂිකයක් 2 වන වගන්තිය යටතේ ගෙවනු ලැබීමට හිමිකම් ලැබිය යුතු ය; තව ද

(ආ) සේවක අර්ථසාධක අරමුදලට දායකවීමට වූ තම බැඳීම ආරම්භ වීමෙන් පසුව වූ සම්පූර්ණ වශයෙන් සේවය කරන ලද එක් එක් වර්ෂය සඳහා මේ උපවගන්තියෙහි (අ) ඡේදයෙහි සඳහන් ආකාරයෙන් ම ආගණනය කරන ලද, දින හතක වැටුපට හෝ වේතනයට සමාන මුදලක පාරිතෝෂිකයක් 2 වන වගන්තිය යටතේ ගෙවනු ලැබීමට හිමිකම් ලැබිය යුතු ය.

(2) කුලීකරුවකු වශයෙන් නොවන යම් තත්ත්වයකින් කම්කරුවකු සේවයෙහි නියුක්ත කර ඇති අවස්ථාවක—

(i) ඒ කම්කරුවා 1972 අගෝස්තු මස 26 වන දින ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත සතු කරන ලද යම් කෘෂිකාර්මික ඉඩමක සේවයෙහි නියුක්ත කරනු ලැබුවේ නම්, 1972 අගෝස්තු සම්පූර්ණ මාසය සඳහා ඔහු විසින් වැඩ කරනු ලැබුවේ නම්, ඒ මාසය වෙනුවෙන් ඔහුට ගෙවිය යුතුව තිබුණු වැටුපේ හෝ වේතනයේ දළ අනුප්‍රමාණය පදනම් කරගෙන ;

(ii) ඒ කම්කරුවා 1975 ඔක්තෝබර් මස 17 වන දින ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත සතු කරන ලද යම් වතු ඉඩමක සේවයෙහි නියුක්ත කරනු ලැබුවේ නම්, 1975 ඔක්තෝබර් සම්පූර්ණ මාසය සඳහා ඔහු විසින් වැඩ කරනු ලැබුවේ නම්, ඒ මාසය වෙනුවෙන් ඔහුට ගෙවිය යුතුව තිබුණු වැටුපේ හෝ වේතනයේ අනුප්‍රමාණය පදනම් කරගෙන ;

(iii) ඒ කම්කරුවා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගන්නා ලද යම් ඉඩමක සේවයෙහි නියුක්ත කරනු ලැබුවේ නම්, ඒ ඉඩම අත්කර ගනු ලැබුවේ යම් මාසයක ද ඒ සම්පූර්ණ මාසය සඳහා ඔහු විසින් වැඩ කරනු ලැබුවේ නම්, ඒ මාසය වෙනුවෙන් ඔහුට ගෙවිය යුතුව තිබුණු වැටුපේ හෝ වේතනයේ අනුප්‍රමාණය පදනම් කරගෙන

ඒ කම්කරුවා මේ උපවගන්තියේ (i) වන ඡේදයෙහි සඳහන් කම්කරුවකු වන අවස්ථාවක, 1972 අගෝස්තු මස 26 වන දින තෙක් නැතහොත් ඒ කම්කරුවා මේ උපවගන්තියේ (ii) වන ඡේදයෙහි සඳහන් කම්කරුවකු වන අවස්ථාවක, 1975 ඔක්තෝබර් මස 18 වන දින තෙක් හෝ ඒ කම්කරුවා මේ උපවගන්තියේ (iii) වන ඡේදයෙහි සඳහන් කම්කරුවකු වන අවස්ථාවක, ඒ අත්කර ගැනීමේ දිනය තෙක් වූ කාලසීමාව සඳහා ඒ කම්කරුවා වෙනුවෙන් සේවක අර්ථ සාධක අරමුදලට හෝ අනුමත අර්ථ සාධක අරමුදලකට හෝ යම් විශ්‍රාම වැටුප් අරමුදලකට හෝ සේවායෝජකගේ දායක මුදල් අඩු කිරීමෙන් පසු, සම්පූර්ණ වශයෙන් සේවය කරන ලද එක් එක් වර්ෂය සඳහා ඒ කම්කරුවාගේ එක් මාසයක දළ වැටුපට හෝ වේතනයට සමාන මුදලක අනුප්‍රමාණය අනුව ආගණනය කරනු ලැබූ 2 වන වගන්තිය යටතේ වූ පාරිතෝෂිකයක් ගෙවනු ලැබීමට ඔහු හිමිකම් ලැබිය යුතු ය.

(3) කම්කරු විනිශ්චයාධිකාරයක ආඥාවක් හෝ කාර්මික ආරවුල් පනත යටතේ වූ ප්‍රදානයක් හෝ බේරුම් කිරීමක් හෝ අනුව, කම්කරුවකුගේ සේවාවන් වෙනුවෙන් සේවායෝජකයකු විසින් පාරිතෝෂිකයක් ගෙවනු ලැබ ඇති අවස්ථාවක, ඒ සේවාවන් වෙනුවෙන් මේ කොටස යටතේ පාරිතෝෂිකයක් ගෙවීමට ඒ සේවායෝජක යටත් නොවිය යුතු ය.

4. (1) මේ කොටසේ විධිවිධාන අදාළ වන්නේ යම් කම්කරුවකුට ද ඒ කම්කරුවා සේවයෙහි නියුක්ත කරනු ලැබූ යම් ඉඩමක් ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත සතු කරනු ලැබ ඇත්තා වූ හෝ එසේ සතු කරනු ලැබ ඇතැයි සලකනු ලබන්නා වූ අවස්ථාවක, වෙනත් යම් නීතියක විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, අවශ්‍ය යයි කොමසාරිස්වරයා සලකන යම් පරීක්ෂණයකින් පසු, ඒ සතු කිරීමේ හෝ අත්කර ගැනීමේ දිනයට පෙරාතුව සේවායෝජක යටතේ වූ ඔහුගේ සේවාවන් වෙනුවෙන් ඒ සේවායෝජකගෙන් ඒ කම්කරුවාට පාරිතෝෂිකය වශයෙන් ලැබිය යුතු මුදල සඳහන් කරමින් කොමසාරිස්වරයා විසින් සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය. කම්කරුවකුට පාරිතෝෂිකය වශයෙන් ලැබිය යුතු මුදල සඳහන් කරමින් කොමසාරිස්වරයා විසින් ඉඩම ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත සහතිකයක් නිකුත් කළ යුතු බව.

(2) යම් කම්කරුවකුගේ සේවායෝජකගෙන් ඒ කම්කරුවාට පාරිතෝෂිකය වශයෙන් ලැබිය යුතු මුදල සඳහන් කරමින් (1) වන උපවගන්තිය යටතේ වූ සහතිකයක් කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලබන අවස්ථාවක, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින්, 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, කොමසාරිස්වරයා මගින් කම්කරුවාට ඒ මුදල ගෙවීම කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියෙහි සඳහන් සහතිකය නිකුත් කරනු ලබන්නේ යම් කම්කරුවකු වෙනුවෙන් ද, ඒ සහතිකයේ පිටපතක් ඒ කම්කරුවාගේ සේවායෝජක වෙත කොමසාරිස්වරයා විසින් යවනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් කම්කරුවකුට ගෙවන ලද මුදල හෝ 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ප්‍රේෂණය කරන ලද මුදල, ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 32 වන වගන්තිය යටතේ හෝ 42ඒ වගන්තිය යටතේ හෝ ඒ කම්කරුවාගේ සේවායෝජකට ගෙවිය යුතු වන්දිය මත ප්‍රථම වැය බරක් විය යුතු අතර, ඒ සේවායෝජකට ප්‍රදානය කරනු ලබන වන්දි මුදලින් ඒ මුදල අඩු කර ගනු ලැබිය යුතු ය.

## II වන කොටස

මේ පනත ක්‍රියාත්මක වීමෙන් පසුව වූ සේවය අවසන් කිරීම් සඳහා තම කම්කරුවන්ට පාරිතෝෂික ගෙවීම සම්බන්ධයෙන් සේවායෝජකගේ බැඳීම.

5. (1) යම් කර්මාන්තයක කම්කරුවකුගේ සේවාවන් අවසන් කිරීමට ඉහතින් ම වූ මාස දොළහක කාලය ඇතුළත කිසියම් දිනයක කම්කරුවන් පහළොස් දෙනකු හෝ ඊට වැඩි ගණනක් සේවයෙහි නියුක්ත කරනු ලබන්නා වූ හෝ සේවයෙහි නියුක්ත කර ඇත්තා වූ සෑම සේවායෝජකයකු ම, ඒ සේවායෝජක යටතේ සම්පූර්ණ අවුරුදු පහකට නොඅඩු සේවා කාලයක් ඇති කම්කරුවකුගේ සේවාවන් (සේවායෝජක විසින් හෝ කම්කරුවා විසින් හෝ කම්කරුවාගේ විශ්‍රාම ගැනීම මත හෝ ඔහුගේ මරණය සිදුවීමෙන් හෝ නීතිය ක්‍රියාත්මක වීමෙන් හෝ අන්‍යාකාරයකින් වුව ද) මේ පනත ක්‍රියාත්මක වීමට පසු යම් අවස්ථාවක අවසන් කරනු ලැබූ විට, ඒ සේවාවන් වෙනුවෙන් මේ කොටසේ විධිවිධානවලට අනුකූලව ආගණනය කරනු ලැබූ පාරිතෝෂිකයක් ඒ සේවය අවසන් කිරීමේ දින සිට දින තිහක කාලයක් ඇතුළත ඒ කම්කරුවාට ගෙවනු ලැබිය යුතු ය. ඒ අවසන් කිරීම ඒ කම්කරුවාගේ මරණය සිදුවීමෙන් ඇති වන අවස්ථාවක, මේ කොටසේ විධිවිධානවලට අනුකූලව ආගණනය කරනු ලැබූ පාරිතෝෂිකයක් ඒ සේවාව අවසන් කිරීමේ දින සිට දින තිහක කාලයක් ඇතුළත ඔහුගේ උරුමක්කාරයන්ට ගෙවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සේවායෝජකයකු වෙත නියම කරන ලද බැඳීම ඉටු කිරීමට පෙර ඒ සේවායෝජකගේ මරණය සිදු වූ විටක, ඔහුගේ නීත්‍යනුකූල නියෝජිතයා විසින් ඒ බැඳීම ඉටු කරනු ලැබිය යුතු ය.

(3) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 34 දරන පෙරලා සියරට යවනු ලබන ඉන්දියානුවන්ට පාරිතෝෂික හා වෙනත් මූල්‍ය ප්‍රතිලාභ ගෙවීමේ (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, ඒ පනතේ අර්ථකථනය කර ඇති පරිදි වූ පෙරලා සියරට යවනු ලබන ඉන්දියානුවකු මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි සඳහන් වර්ගයට අයත් කම්කරුවකු වන්නේ නම්, මේ කොටස යටතේ පාරිතෝෂිකයක් ගෙවිය යුතු සේවා කාලයක් සම්බන්ධයෙන් එකී පනතේ විධිවිධාන යටතේ පාරිතෝෂිකයක් ලැබීමට ඒ පෙරලා සියරට යවනු ලබන්නාට හිමිකම නොතිබිය යුතු ය.

පාරිතෝෂිකය ගෙවීමේ අනුප්‍රමාණය.

6. (1) සේවායෝජකයකු යටතේ වූ සම්පූර්ණ සේවා කාලය සම්බන්ධයෙන් යම් කර්මාන්තයක සේවයෙහි නියුක්ත කරන ලද කම්කරුවකුට සහ ඔහු සම්බන්ධයෙන් මේ කොටසේ විධිවිධාන අදාළ විය යුතු ය :

එසේ වුව ද මේ පනතේ I වන කොටස යටතේ පාරිතෝෂිකයකට හිමිකම ඇති කම්කරුවකු සේවයෙහි නියුක්තව සිටි කෘෂිකාර්මික ඉඩම හෝ වතු ඉඩම, ඉඩම් ප්‍රතිසංස්කරණ පනත ක්‍රියාත්මක වීමෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත සතු කරනු ලැබීමෙන් හෝ ඔහු සේවයෙහි නියුක්තව සිටි ඉඩම, ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගනු ලැබීමෙන් පසු ඔහු නොකඩව සේවයෙහි නියුක්තව සිටින්නා වූ ද මේ පනතේ II වන කොටස යටතේ වූ පාරිතෝෂිකයකට ඒ කම්කරුවාට හිමිකම ඇත්තා වූ ද අවස්ථාවක, ඒ කම්කරුවාගේ සේවා කාලයට මේ පනතේ I වන කොටස යටතේ පාරිතෝෂිකයකට ඔහුට හිමිකම ඇත්තේ යම් සේවා කාලයක් සම්බන්ධයෙන් ද ඒ සේවා කාලය ඇතුළත් විය යුතු අතර, සමස්ථ සේවා කාලය සම්බන්ධයෙන් වූ පාරිතෝෂිකය, 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාර එය ගෙවීමට යටත් සේවායෝජක විසින් ගෙවනු ලැබිය යුතු ය :

එසේ ම තවදුරටත් මේ පනතේ I වන කොටසේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ඒ කොටස යටතේ ඒ කම්කරුවාට හිමිකම ඇති පාරිතෝෂිකයේ මුදල එකී සේවායෝජක වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු අතර, ඒ කම්කරුවාගේ සමස්ථ සේවා කාලය සම්බන්ධයෙන් පාරිතෝෂිකයක් ගෙවීමට ඒ සේවායෝජක යටත් විය යුතු ය.

(2) 5 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි සඳහන් කම්කරුවකු—

(අ) ඒ කම්කරුවා මාසික පඩි ලබන කම්කරුවකු වන විටක, ඒ කම්කරුවා විසින් අන්තිමට ලබා ගන්නා ලද වැටුපේ හෝ වේතනයේ අනුප්‍රමාණය අනුව ආගණනය කරනු ලැබූ, සම්පූර්ණ වශයෙන් සේවය කරන ලද එක් එක් වර්ෂය සඳහා, මාස භාගයක වැටුපට හෝ වේතනයට ; සහ

(ආ) ඒ කම්කරුවා වෙනත් යම් කම්කරුවකු වන විටක, ඒ කම්කරුවා විසින් අන්තිමට ලබා ගන්නා ලද වැටුපේ හෝ වේතනයේ අනුප්‍රමාණය අනුව ආගණනය කරනු ලැබූ, සම්පූර්ණ වශයෙන් සේවය කරන ලද එක් එක් වර්ෂය සඳහා, දින දහහතරක වැටුපට හෝ වේතනයට

සමාන මුදලක් පාරිතෝෂිකය වශයෙන් ලැබීමට හිමිකම් ලැබිය යුතු ය :

එසේ වුව ද කෑලි ප්‍රමාණය අනුව ගෙවීම් ලබන කම්කරුවකු සම්බන්ධයෙන් වන විටක, ඔහුගේ සේවා නියුක්තිය අවසන් කිරීමට ඉහතින් ම වූ මාස තුනක කාලයක් සඳහා ඔහුට ලැබුණ මුළු වැටුප හෝ වේතනය ඒ කාලය තුළ ඔහු විසින් වැඩ කරන ලද දින ගණනින් බෙදීමෙන් දෛනික වැටුප හෝ වේතනය ආගණනය කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ ඇතුළත් විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, මේ පනතේ I වන කොටස යටතේ පාරිතෝෂිකයකට තමාට හිමිකම ඇත්තා වූ සේවා කාලය සම්බන්ධයෙන් (1) වන උපවගන්තියේ අතුරු වගන්තියෙහි සඳහන් කම්කරුවකුට ගෙවිය යුතු පාරිතෝෂිකය, ඒ ඉඩම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන්

සභාව වෙත සතු කර ගනු ලැබූ හෝ ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගනු ලැබූ මාසයේ දී ඔහුට ගෙවිය යුතු වැටුපේ හෝ වේතනයේ අනුප්‍රමාණය පදනම් කරගත් සම්පූර්ණ වශයෙන් සේවය කරන ලද එක් එක් වර්ෂය සඳහා ඒ කම්කරුවාගේ දින දහහතරක වැටුපට හෝ වේතනයට සමාන මුදලක අනුප්‍රමාණය අනුව ආගණනය කරනු ලැබිය යුතු ය.

5 වන වගන්තිය අදාළ කිරීම පිළිබඳ සීමා.

7. 5 වන වගන්තියේ විධිවිධාන—

(අ) පෞද්ගලික නිවසක ගෘහ සේවකයකු වශයෙන් හෝ පෞද්ගලික රියදුරකු වශයෙන් හෝ සේවයෙහි නියුක්ත ; හෝ

(ආ) දායක නොවන යම් විශ්‍රාම වැටුප් ක්‍රමයක් යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම ඇති

කම්කරුවකුට හෝ කම්කරුවකු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

## III වන කොටස

### පොදු විධිවිධාන

පැහැර හරින්නා විසින් ගෙවීම පැහැර හැරීමේ දී පාරිතෝෂිකය අයකර ගැනීම.

8. (1) මේ පනත යටතේ පාරිතෝෂිකය වශයෙන් ලැබිය යුතු යම් මුදලක් ගෙවීමෙහි ලා යම් පැහැර හැරීමක් කරනු ලැබ ඇති අවස්ථාවක, හෝ මේ පනත යටතේ ලැබිය යුතු පාරිතෝෂිකය 4 වන වගන්තියේ විධිවිධාන යටතේ හෝ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 17 වන වගන්තියේ (5) වන උපවගන්තියේ විධිවිධාන යටතේ හෝ අය කර ගනු ලැබිය නොහැකි අවස්ථාවක, අවශ්‍ය යයි කොමසාරිස්වරයා සලකන යම් පරීක්ෂණයකින් පසු, පාරිතෝෂිකය වශයෙන් ලැබිය යුතු මුදල සහ පැහැර හරින්නාගේ නම සහ පදිංචි ස්ථානය සඳහන් කරමින් ඔහු විසින්, ඒ වත්ත හෝ ආයතනය පිහිටා ඇති කොට්ඨාසය විෂයයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයා වෙත සහතිකයක් නිකුත් කරනු ලැබිය හැකි ය. එවිට ඒ මහේස්ත්‍රාත්වරයා විසින්, මේ පනත යටතේ පාරිතෝෂිකය වශයෙන් ලැබිය යුතු මුදල අයකර ගැනීම සඳහා ඔහුට විරුද්ධව වැඩිදුර නඩු කටයුතු නොගත යුත්තේ මන්දැයි හේතු දැක්වීම පිණිස පැහැර හරින්නා තමා ඉදිරියට කැඳවිය යුතු අතර, ඔහු විසින් ප්‍රමාණවත් හේතු දැක්වීම පැහැර හරිනු ලැබුවහොත්, ඒ පැහැර හරිනු ලැබූ මුදල, දඩයකින් පමණක් දඬුවම් කළ යුතු හෝ බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් නොකළ යුතු හෝ වරදක් සම්බන්ධයෙන් ඒ පැහැර හරින්නා විෂයයෙහි මහේස්ත්‍රාත්වරයාගේ දණ්ඩන නියමයකින් නියම කරන ලද දඩයක් ලෙස සලකනු ලැබිය යුතු ය ; තව ද, එවැනි යම් වරදක් සඳහා නියම කරන ලද දඩයක් ගෙවීම පැහැර හැරීමට අදාළ 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (එහි (අ), (ආ) සහ (එ) ඡේද හැර) විධිවිධාන එවිට අදාළ විය යුතු අතර, ඒ දණ්ඩන නියමය කළ අවස්ථාවේ දී ඒ උපවගන්තියේ විධිවිධාන අනුව මහේස්ත්‍රාත්වරයා විසින් කළ හැකිව තිබූ යම් තීරණයක් මහේස්ත්‍රාත්වරයා විසින් කරනු ලැබිය හැකි ය.

(2) පැහැර හරින්නාගෙන් මේ පනත යටතේ ලැබිය යුතු මුදල යථා පරිදි ආගණනය කර ඇති බවට සහ ඒ මුදල පැහැර හැර ඇති බවට කොමසාරිස්වරයාගේ සහතිකය මුල් බැල්මට පෙනෙන සාක්ෂිය වන්නේ ය.

(3) මේ වගන්තිය යටතේ අධිකරණය විසින් අයකර ගන්නා ලද හැම මුදලක් ම, කොමසාරිස්වරයා වෙත ගෙවනු ලැබිය යුතු අතර, එවිට මේ පනත යටතේ ඊට හිමිකම ඇති තැනැත්තාට හෝ තැනැත්තන්ට ඒ මුදල ඔහු විසින් ගෙවනු ලැබිය යුතු ය.

(4) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සිට (5) වන උපවගන්තිය තෙක් වූ උපවගන්තිවල සඳහන් කිසිවක්, ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි සඳහන් යම් අවස්ථාවක් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය මගින් යම් පැහැර හරින්නකු වෙත නියම කරන ලදැයි සලකනු ලබන දඩය ඔහු විසින් ගෙවීම පැහැර හැරීමේ දී ඒ පැහැර හරින්නා බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කරනු ලබන ඒ උපවගන්තියෙහි සඳහන් යම් අවස්ථාවක දී, ඒ දඩ මුදල ගෙවීම සඳහා මහෙස්ත්‍රාත්වරයා විසින් ඔහුට කල් දෙනු ලැබිය හැකි ය; නැතහොත් ඒ මුදල වාරිකවලින් ගෙවන ලෙස විධාන කළ හැකි ය.

(6) (1) වන උපවගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි හේතු දැක්වීම සඳහා හෝ (5) වන උපවගන්තිය යටතේ දඩය ගෙවීම සඳහා හෝ කල් දීම පිණිස පූර්ව කොන්දේසියක් වශයෙන් අධිකරණය විසින් ඇප තබන ලෙස නියම කරනු ලැබිය හැකි අතර, ඇප තබන ලෙස පැහැර හරින්නාට එසේ නියම කරනු ලැබූ අවස්ථාවක, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XXIV වන පරිච්ඡේදයේ විධිවිධාන එහි ලා අදාළ විය යුතු ය.

(7) ගෙවීමක්, වාරිකවලින් කළ යුතු බවට (5) වන උපවගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයකු විසින් විධාන කරනු ලැබ ඇත්තා වූ ද, ඒ වාරිකවලින් කවර හෝ වාරිකයක් ගෙවීමෙහි ලා පැහැර හැරීමක් කරනු ලැබ ඇත්තා වූ ද අවස්ථාවක, එවකට නොගෙවා ඉතිරිව ඇති සියලු වාරික ගෙවීමෙහි ලා පැහැර හැරීමක් කර ඇති ලෙස කටයුතු කරනු ලැබිය හැකි ය.

9. මේ පනත යටතේ යම් කම්කරුවකුට ලැබිය යුතු යම් පාරිතෝෂිකයක ගෙවීමක් ඒ කම්කරුවා විසින් ලබා ගැනීමට පෙර ඔහුගේ මරණය සිදුවුවහොත්, එය ඔහුගේ උරුමක්කාරයන්ට ගෙවනු ලැබිය යුතු ය. ඇතැම් අවස්ථාවල දී පාරිතෝෂිකය ගෙවනු ලැබිය යුතු තැනැත්තෝ.

10. (1) කම්කරුවකුට ගෙවිය යුතු පාරිතෝෂිකය සාමූහික ගිවිසුමකින්, කාර්මික ආරවුල් පනත යටතේ වූ කාර්මික අධිකරණ සක හෝ බේරුම්කරුවකුගේ ප්‍රදානයකින් හෝ වෙනත් යම් ගිවිසුමකින් පාලනය වන අවස්ථාවක, ඔහුගේ සේවාවන් සම්බන්ධයෙන් ඒ පාරිතෝෂිකය ආගණනය කිරීම, ඒ සාමූහික ගිවිසුමේ, පාරිතෝෂිකය වාසිදායක ලෙස ආගණනය කළ යුතු බව.

කාර්මික අධිකරණයේ හෝ බේරුම්කරුගේ ප්‍රදානයේ හෝ වෙනත් ගිවිසුමේ දක්වා ඇති පාරිතෝෂිකය හෝ ආන්තික ප්‍රතිලාභ මේ පනත යටතේ ගෙවිය යුතු පාරිතෝෂිකයට වඩා කම්කරුවාට වාසි දායක වන්නේ නම්, අවස්ථාවෝචිත පරිදි, ඒ සාමූහික ගිවිසුමේ, කාර්මික අධිකරණයේ හෝ බේරුම්කරුගේ ප්‍රදානයේ හෝ වෙනත් ගිවිසුමේ නියමයන්ට අනුකූලව කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ වූ පාරිතෝෂිකයට අතිරේකව හෝ ප්‍රති ලෝම වශයෙන් හෝ යම් සාමූහික ගිවිසුමක, කාර්මික අධිකරණ යක හෝ බේරුම්කරුවකුගේ ප්‍රදානයක හෝ වෙනත් ගිවිසුමක නියම අනුව පාරිතෝෂිකයකට හෝ ආන්තික ප්‍රතිලාභයකට කිසිම කම්කරුවකු හිමිකම් නොලැබිය යුතු ය.

පරිශ්‍රවලට ඇතුළුව ඒවා පරීක්ෂා කිරීමට කොමසාරිස් වරයාට සහ වෙනත් නිලධරයාට ඇති බලය.

**11.** (1) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් තත් කාර්ය සඳහා ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින්—

(අ) මේ පනත යටතේ පාරිතෝෂිකය ආගණනය කිරීමට අදාළ යම් පොත් හෝ ලේඛන පරීක්ෂා කිරීම සඳහා දිවා හෝ රාත්‍රී කාලයේ සියලු යුක්තිසහගත වේලාවන්හි දී යම් පරිශ්‍රවලට හෝ ස්ථානවලට ඇතුළුව ඒවා පරීක්ෂා කිරීම ;

(ආ) එවැනි යම් පොත්වල හෝ ලේඛනවල ඇතුළත් යම් සටහන්වලින් පිටපත් සෑදීම හෝ උද්ධෘත ගැනීම ; සහ

(ඇ) මේ පනත යටතේ යම් මුදලක් ගෙවීම සම්බන්ධයෙන් පැහැර හැරීමක් කර ඇති සේවායෝජකයකු හෝ තැනැත්තකු යයි විශ්වාස කිරීමට තමාට යුක්තිසහගත හේතු ඇති යම් තැනැත්තකු පරීක්ෂා කිරීම

කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ යම් බලයක් ක්‍රියාත්මක කිරීමෙහි ලා කොමසාරිස්වරයාට හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් නිලධරයකුට හෝ කිසිම තැනැත්තකු විසින් බාධා කිරීම හෝ ප්‍රතිරෝධය පෑම නොකළ යුතු ය.

ලේඛන සහ වාර්තා සැපයීමට කොමසාරිස් වරයාට ඇති බලය.

**12.** කොමසාරිස්වරයා විසින් හෝ තත් කාර්ය සඳහා කොමසා රිස්වරයා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් හෝ යම් සේවායෝජකයකු වෙත ලියවිල්ලකින් කරනු ලබන විධානයක් මගින් ඒ විධානයෙහි සඳහන් කරනු ලැබිය හැකි, ඒ සේවායෝජකයාගේ යම් කම්කරුවකු සම්බන්ධයෙන් මේ පනත යටතේ ලැබිය යුතු පාරිතෝෂිකය ආගණනය කිරීමට අදාළ වූ හා ඒ විධානයෙහි දක්වනු ලබන යම් පොත් හා ලේඛන, ඒ විධානයෙහි සඳහන් කරනු ලැබිය හැකි යම් වේලාවක හා ස්ථානයක දී තමා විසින් පරීක්ෂා කරනු ලැබීම පිණිස ඉදිරිපත් කරන ලෙස ඒ සේවා යෝජකට විධාන කළ හැකි අතර, ඒ සේවායෝජක විසින් ඒ විධානය අනුව ක්‍රියා කළ යුතු ය.

**13.** මේ පනතේ II වන කොටස යටතේ පාරිතෝෂිකයක් ගෙවනු ලැබිය යුතු වූ ද, වංචා කිරීමේ, සේවායෝජකගේ අරමුදල් ව්‍යපහරණය කිරීමේ, සේවායෝජකගේ දේපළවලට හිතාමතා ම අලාභ සිදු කිරීමේ හෝ සේවායෝජකගේ බඩුවලට, දේවලට හෝ දේපළවලට පාඩු සිදු කිරීමේ හේතු නිසා සේවාවන් අවසන් කරනු ලැබුවා වූ ද යම් කම්කරුවකු, ඔහු විසින් සිදු කරන ලද අලාභයේ හෝ පාඩුවේ ප්‍රමාණයට ඒ පාරිතෝෂිකය අහිමි කරනු ලැබිය යුතු ය.

පාරිතෝෂිකය අහිමි කිරීම.

**14.** සේවායෝජකයකු වීමෙන් පසු අවුරුදු පහක කාලයක් ඇතුළත ඒ සේවායෝජක විසින් යම් ඉඩමක් හෝ ආයතනයක් විකුණනු ලබන හෝ අන්‍යාකාරයකින් අන්සතු කරනු ලබන අවස්ථාවක, ඒ සේවායෝජක යටතේ වූ යම් කම්කරුවකුගේ සේවා කාලය, අලුත් සේවායෝජක විසින් ඒ කම්කරුවාට ගෙවිය යුතු පාරිතෝෂිකය ආගණනය කිරීමේ දී, අලුත් සේවායෝජක යටතේ වූ ඒ කම්කරුවාගේ සේවා කාලයට එකතු කරනු ලැබිය යුතු ය.

ඇතැම් අවස්ථාවල දී වර්තමාන සේවායෝජක විසින්, කම්කරුවාගේ කලින් සේවායෝජක යටතේ වූ සේවා කාලය ගණන් ගත යුතු බව.

**15.** (1) මේ පනතේ යම් විධිවිධානයක් කඩ කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

වැරදි.

(2) මේ පනත යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන අවස්ථාවක—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ වරද සිදු කරන ලද අවස්ථාවේ දී ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු වූ සෑම තැනැත්තකු ම ; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නොවන පුද්ගල මණ්ඩලයක් නම්, වරද සිදු කරන ලද අවස්ථාවේ දී ඒ පුද්ගල මණ්ඩලයේ සාමාජිකයකුව සිටි සෑම තැනැත්තකු ම

ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද, ඒ වරද සිදු කරනු ලැබුවේ තමාගේ දැනුම නොමැතිව බව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීමෙහි ලා තමා නිසි සියලු උද්‍යෝගයෙන් ක්‍රියා කළ බව යම් අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ සාමාජිකයකු විසින් ඔප්පු කරනු ලැබුවහොත්, ඒ අධ්‍යක්ෂවරයා, නිලධරයා හෝ සාමාජිකයා ඒ වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

වරද සම්බන්ධයෙන් වෙනත් යම් තැනැත්තකු වැරදිකරු බව චූදිතයා විසින් ඔප්පු කරනු ලබන අවස්ථාවක.

**16.** මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් (මෙහි මින් මතු "චූදිතයා" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තකුට චෝදනා කරනු ලැබ ඇති අවස්ථාවක, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 136 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඔහු විසින් යථා පරිදි කරන ලද පැමිණිල්ලක් මත සහ තම අභිප්‍රාය පිළිබඳ දින තුනකට නොඅඩු දැන්වීමක් පැමිණිලි පක්ෂයට දෙනු ලැබූ විට, සැබෑ වරදකරු වශයෙන් ඔහු විසින් චෝදනා කරනු ලබන වෙනත් යම් තැනැත්තකු අධිකරණය ඉදිරියට පමුණුවා ලීමට ඔහුට හිමිකම ඇත්තේ ය. තව ද, වරද සිදු කිරීම ඔප්පු කරනු ලැබීමෙන් පසු ඒ වෙනත් තැනැත්තාගේ ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් නිසා වරද සිදු වූ බව අධිකරණය සෑහීමට පත් කරන ආකාරයෙන් චූදිතයා විසින් ඔප්පු කරනු ලැබුවහොත්, ඒ වෙනත් තැනැත්තා වරද සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබිය හැකි අතර, මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීමට තමා නිසි සියලු උද්යෝගය යොදන ලද බව, චූදිතයා විසින් තවදුරටත් ඔප්පු කරනු ලැබුවහොත්, වරද සම්බන්ධයෙන් ඔහු නිදොස් කරනු ලැබිය යුතු ය.

131 වන අධිකාරය සංශෝධනය කිරීම.

**17.** (1) කාර්මික ආරවුල් පනතේ 31අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ—

(i) (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) සේවාවන් අවසන් කිරීම සම්බන්ධයෙන් විනිශ්චයාධිකාරය වෙත ඉල්ලීම කරනු ලබන්නේ යම් කම්කරුවකු විසින් ද, නැතහොත් යම් කම්කරුවකු වෙනුවෙන් ද, ඒ කම්කරුවාගේ සේවාවන් අවසන් කිරීමට ඉහතින් වූ මාස දොළහක කාලය තුළ යම් දිනයක කම්කරුවන් පහළොස් දෙනකුට අඩු සංඛ්‍යාවක් සේවයෙහි නියුක්ත කරනු ලබන්නා වූ යම් කර්මාන්තයක ඒ කම්කරුවා සේවයෙහි නියුක්ත කර ඇති අවස්ථාවක, ඒ කම්කරුවාගේ සේවාවන් අවසන් කරනු ලැබීමේ දී ඔහුගේ සේවායෝජකයාගෙන් යම් පාරිතෝෂිකයක් හෝ වෙනත් ප්‍රතිලාභ ඔහුට ලැබිය යුතු ද යන ප්‍රශ්නය සහ ඒ පාරිතෝෂිකයේ මුදල් ප්‍රමාණය හා ඒ ප්‍රතිලාභවල ස්වභාවය හා ප්‍රමාණය ;";

(ii) ඒ උපවගන්තියේ (ඇ) ඡේදය එහි (ආ) ඡේදය වශයෙන් නැවත අක්ෂර යෙදීමෙන් ;

(iii) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඇ) 1983 පාරිතෝෂික ගෙවීමේ පනත ප්‍රකාර පාරිතෝෂිකයක් අහිමි කිරීම, ඒ පනත ප්‍රකාර නිවැරදිව කරනු ලැබ තිබේ ද යන ප්‍රශ්නය ;"; සහ

(ආ) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ (ඇ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇ) යම් තැනැත්තකු විසින් යම් කම්කරුවකු සේවයෙහි නියුක්ත කරනු ලැබුවේ යම් කාලයක් තුළ ද ඒ කාලය සම්බන්ධයෙන් වැටුප් වශයෙන් හෝ ඒ කම්කරුවා නැවත සේවයෙහි පිහිටුවීමට විකල්පයක් ලෙස වන්දි වශයෙන් හෝ යම් මුදලක් ඒ කම්කරුවාට ගෙවන ලෙස, එවැනි යම් ඉල්ලීමක් මත කම්කරු විනිශ්චයාධිකාරයක් විසින් ඒ තැනැත්තාට ආඥාවක් කරනු ලැබිය හැකි අතර, ඔහු ඒ සේවායෝජක වූවාක් මෙන් සලකා ඒ සමාන ආකාරයකින්ම ඒ තැනැත්තාට විරුද්ධව ඒ ආඥාව බලාත්මක කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද යම් කර්මාන්තයක කම්කරුවන් පහළොස් දෙනකුට අඩු සංඛ්‍යාවක් සේවයෙහි නියුක්ත කරනු ලැබූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, මේ ඡේදයේ ඉහතින් වූ විධිවිධානවලින් ප්‍රදානය කරන ලද සහනවලට අතිරේකව, ඒ තැනැත්තා විසින් ඒ කම්කරුවාට පාරිතෝෂිකයක් ගෙවීමට කම්කරු විනිශ්චයාධිකාරයක් විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.".

(2) කාර්මික ආරවුල් පනතේ 33 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ඉ) (1983 පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ පාරිතෝෂිකයක් ගෙවිය යුතු වූ අවස්ථාවක දී හැර) සේවායෝජකයකු විසින් යම් කම්කරුවකුට පාරිතෝෂිකයක් හෝ විශ්‍රාම වැටුපක් හෝ ප්‍රසාද මුදලක් ගෙවීම, ඒ පාරිතෝෂිකයේ, විශ්‍රාම වැටුපේ හෝ ප්‍රසාද මුදලේ ප්‍රමාණය සහ ඒ ප්‍රමාණය ආගණනය කිරීමේ ක්‍රමය හා ඒ පාරිතෝෂිකය, විශ්‍රාම වැටුප හෝ ප්‍රසාද මුදල ගෙවනු ලැබිය යුත්තේ යම් කාලයක් ඇතුළත ද ඒ කාලය පිළිබඳව.".

ඉඩම් ප්‍රතිසංස්කරණ පනත සංශෝධනය කිරීම.

18. (1) ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 32 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උප වගන්ති ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'(3) කොමිෂන් සභාව වෙත සතු කරන ලද යම් කෘෂිකාර්මික ඉඩමක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු (1) වන උපවගන්තිය යටතේ වන්දියක් ලැබීමට හිමිකම් ලබන අවස්ථාවක, කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින්, ඒ තැනැත්තාට යුක්ති සහගත දැන්වීමක් කිරීමෙන් පසුව, ඒ ඉඩමෙහි සේවයෙහි නියුක්ත කරනු ලැබූ යම් තැනැත්තකුට හිඟ වැටුප්, අර්ථ සාධක අරමුදලේ දායක මුදල්, පාරිතෝෂිකයක් හෝ වෙනත් මූල්‍ය ප්‍රතිලාභ වශයෙන් ඒ තැනැත්තාගෙන් ලැබිය යුතු ලෙසට කම්කරු කොමසාරිස්වරයාගේ අත්සන යටතේ සහතික කරන ලද යම් මුදලක් ඒ වන්දියෙන් කම්කරු කොමසාරිස්වරයාට ගෙවනු ලැබිය යුතු ය.

මේ උපවගන්තියේ කාර්යය සඳහා "වන්දිය" යන යෙදුමට ඒ වන්දිය මත උපචිතව ලැබිය යුතු යම් පොලියක් ද ඇතුළත් වේ.

(4) කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද සහතිකය මත කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් ගෙවන ලද මුදල, සේවා යෝජකට ගෙවිය යුතු වන්දිය මත ප්‍රථම වැය බරක් විය යුතු ය.'.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය මගින් ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 32 වන වගන්තියට කරන ලද සංශෝධන 1972 අගෝස්තු මස 26 වන දින ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

460 වන අධිකාරය සංශෝධනය කිරීම.

19. ඉඩම් අත්කර ගැනීමේ පනතේ 17 වන වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උප වගන්ති ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

'(5) මේ පනත යටතේ අත්කර ගන්නා ලද යම් ඉඩමක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු (1) වන උපවගන්තිය යටතේ වන්දියක් ලැබීමට හිමිකම් ලබන අවස්ථාවක, අත්කර ගන්නා නිලධරයා විසින්, ඒ තැනැත්තාට යුක්ති සහගත දැන්වීමක් කිරීමෙන් පසුව, ඒ ඉඩමෙහි සේවයෙහි නියුක්ත කරනු ලැබූ යම් තැනැත්තකුට හිඟ වැටුප්, අර්ථසාධක අරමුදලේ දායක මුදල්, පාරිතෝෂිකයක් හෝ වෙනත් මූල්‍ය ප්‍රතිලාභ වශයෙන් ඒ තැනැත්තාගෙන් ලැබිය යුතු ලෙසට කම්කරු කොමසාරිස්වරයාගේ අත්සන යටතේ සහතික කරන ලද යම් මුදලක් ඒ වන්දියෙන් කම්කරු කොමසාරිස්වරයාට ගෙවනු ලැබිය යුතු ය.

මේ උපවගන්තියේ කාර්යය සඳහා "වන්දිය" යන යෙදුමට ඒ වන්දිය මත උපචිතව ලැබිය යුතු යම් පොලියක් ද ඇතුළත් වේ.

(6) කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද සහතිකය මත අත්කර ගැනීමේ නිලධරයා විසින් ගෙවන ලද මුදල, සේවායෝජකට ගෙවිය යුතු වන්දිය මත ප්‍රථම වැය බරක් විය යුතු ය.'.

**20.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි— අර්ථ නිරූපණය.

"අත්කර ගැනීමේ නිලධරයා" යන්නෙහි ඉඩම් අත්කර ගැනීමේ පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"කෘෂිකාර්මික ඉඩම" සහ "වතු ඉඩම" යන්නෙහි ඉඩම් ප්‍රතිසංස්කරණ පනතෙහි ඒවාට දී ඇති අර්ථ ම ඇත්තේ ය;

"අනුමත අර්ථසාධක අරමුදල" යන්නෙන්, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ IV වන කොටස යටතේ අනුමත අර්ථසාධක අරමුදලක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද අර්ථසාධක අරමුදලක් අදහස් වේ;

"සාමූහික ගිවිසුම" යන්නෙහි, කාර්මික ආරවුල් පනතේ 5 වන වගන්තියෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"කොමසාරිස්වරයා" යන්නෙන්, තත් කාලයෙහි කම්කරු කොමසාරිස් ධූරය දරන තැනැත්තා අදහස් වන අතර, තත් කාලයෙහි නියෝජ්‍ය හෝ ජ්‍යෙෂ්ඨ සහකාර හෝ සහකාර කම්කරු කොමසාරිස් ධූරය දරන යම් තැනැත්තකු හෝ යම් කම්කරු නිලධරයකු ඊට ඇතුළත් වේ;

"සම්පූර්ණ වශයෙන් සේවය කරන ලද" යන්නෙන්, යම් නොකැඩුණු හෝ කැඩුණු සේවයක් සලසනු ලැබුවේ මේ පනත ක්‍රියාත්මක වීමට පෙර හෝ පසුව හෝ වුව ද, ඒ නොකැඩුණු සේවය අදහස් වන අතර අදාළ කම්කරුවාගේ යම් වරදක් නිසා නොවන කවර හෝ හේතුවක් මත නිවාඩු අනුමත කිරීමක් මගින් හෝ වැඩ වර්ජනයක් හෝ පිටත ලෑමක් නැතහොත් වැඩ අවසන් කිරීමක් මගින් කැඩුණු සේවයක් ද ඊට ඇතුළත් වේ;

"සේවායෝජක" යන්නෙන්, යම් කම්කරුවකු සේවයෙහි නියුක්ත කර ගන්නා යම් තැනැත්තෙක් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් යම් කම්කරුවකු සේවයෙහි නියුක්ත කර ගනු ලබන්නේ යම් තැනැත්තකු වෙනුවෙන් ද ඒ තැනැත්තා හෝ අදහස් වන අතර, සේවායෝජක මණ්ඩලයක්, (ඒ මණ්ඩලය සංස්ථාගත කරනු ලැබූ හෝ සංස්ථාගත කරනු නොලැබූ මණ්ඩලයක් හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ වුව ද) යම් කම්කරුවකු වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් යම් තැනැත්තකු විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන්නේ ද එවැනි යම් තැනැත්තෙක් සහ සේවායෝජකයකු වීම අවසන් කොට ඇති යම් තැනැත්තෙක් හෝ සේවායෝජක මණ්ඩලයක් ඊට ඇතුළත් වන නමුත් ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමූපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද සමූපකාර සමිතියක් හෝ පළාත් පාලන ආයතනයක් ඊට ඇතුළත් නොවේ;

"සේවක අර්ථසාධක අරමුදල" යන්නෙන්, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"පෙරලා සියරට යවනු ලබන ඉන්දියානුවා" යන්නෙහි, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 34 දරන පෙරලා සිය රට යවනු ලබන ඉන්දියානුවන්ට පාරිතෝෂික හා වෙනත් මූල්‍ය ප්‍රතිලාභ ගෙවීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"කර්මාන්තය" යන්නට—

(අ) වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, නිෂ්පාදනයක් සහ කෘෂි කර්මාන්තයක්, වෙළෙඳාමක, ව්‍යාපාරයක, නිෂ්පාදනයක හෝ කෘෂිකර්මාන්තයක ආකාරයෙන් වූ යම් ව්‍යවසායක් හෝ ව්‍යාපෘතියක් සහ වෙළෙඳාමක, ව්‍යාපාරයක, නිෂ්පාදනයක හෝ කෘෂි කර්මාන්තයක යම් අංශයක් හෝ කොටසක්;

(ආ) පළාත් පාලන ආයතනයක හෝ වෙළෙඳාමේ කාර්යය සඳහා වුව ද අන්‍යාකාරයකින් හෝ වුවද ව්‍යවසායක් කරගෙන යාම පිණිස යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ පිහිටුවන ලද සංස්ථාවක හෝ සේවයෙහි නියුක්ත තැනැත්තන් විසින් ඉටු කරනු ලබන කවර හෝ විස්තරයකට අයත් සේවයක්, වැඩක් හෝ ශ්‍රමයක්;

(ඇ) කම්කරුවන්ගේ සෑම ව්‍යාපෘතියක්, ජීවනෝපායක් හෝ සේවයක්; සහ

(ඈ) සේවා යෝජකයන්ගේ සෑම ව්‍යවසායක්

ඇතුළත් වේ;

"කුලීකරුවා" යන්නෙන්, යම් වතු නාමලේඛනයක නම නම ඇතුළත්ව ඇති යම් කුලීකරුවකු හෝ කංකානමක් අදහස් වන අතර, කුලීකරුවකු වීම අවසන් කර ඇති යම් තැනැත්තෙක් ද ඊට ඇතුළත් වේ;

"ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව" යන්නෙහි, ඉඩම් ප්‍රතිසංස්කරණ පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"ඉඩම් ප්‍රතිසංස්කරණ පනත" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 39 දරන පනතින් හා 1981 අංක 14 දරන පනතින් සහ 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත අදහස් වේ;

"නීත්‍යනුකූල නියෝජිතයා" යන්නෙන්, පොල්මෑකරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු හෝ රුපියල් විසි දහසක වටිනාකමට අඩු වටිනාකමක් ඇති බූදලයක් සම්බන්ධයෙන් වන විට උරුමය භාරගන්නා ලද උරුමක්කාරයන් හෝ අදහස් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට හා කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල,

කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ඊට ඇතුළත් වේ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, සමාගම් ආඥාපනත හෝ 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ හැර වෙනත් යම්කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද, ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලින් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ;

"වැටුප හෝ වේතනය" යන්නෙන්—

(අ) මූලික හෝ ඒකාබද්ධ වැටුප හෝ වේතනය;

(ආ) ජීවන වියදම් දීමනාව, විශේෂ ජීවන දීමනාව හෝ වෙනත් සමාන දීමනාවක්; සහ

(ඇ) කෑලි ප්‍රමාණය අනුව ගෙවීම

අදහස් වේ;

"කම්කරුවා" යන්නෙන්, ප්‍රකාශිත හෝ ගම්‍යමාන වුව ද, වාචික හෝ ලිඛිත වුව ද, සේවා ගිවිසුමක් හෝ ආධුනිකත්ව ගිවිසුමක් වුව ද නැතහොත් යම් වැඩක් කිරීම හෝ ශ්‍රමය ක්‍රියාවේ යෙදවීම පිණිස වූ පෞද්ගලික ගිවිසුමක් වුව ද කවර හෝ තත්ත්වයකින් සේවායෝජකයකු සමග ගිවිසුමට ඇතුළත්ව සිටින නැතහොත් සේවායෝජකයකු සමග ගිවිසුමක් යටතේ වැඩ කරන යම් තැනැත්තෙක් අදහස් වන අතර, යම් තැනැත්තකු යම් විශේෂ අවස්ථාවක යම් සේවයක නියුක්ත කරනු ලබන්නේ හෝ නියුක්ත කරනු නොලබන්නේ වුව ද එවැනි යම් ගිවිසුමක් යටතේ සාමාන්‍යයෙන් සේවයෙහි නියුක්ත කරනු ලබන යම් තැනැත්තෙක් ද සේවා අවසන් කරනු ලැබූ යම් කම්කරුවෙක් ද ඊට ඇතුළත් වේ;

"වර්ෂය" යන්නෙන් සම්පූර්ණ කරන ලද මාස දොළහක කාල පරිච්ඡේදයක් අදහස් වේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 යි. (විදේශීය) රු. 40 යි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත පමණක් දායක මුදල් භාරගනු ලැබේ.